# විශේෂ දැනුම්දීමයි

## 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා නේවාසික පහසුකම් සැපයීම

තාක්ෂණ පීඨයේ සිසුන්ට මේ වන විට ස්ථාපිත නේවාසිකාගාර දෙක මඟින් නේවාසික පහසුකම් ලබාදිය හැක්කේ සීමිත සිසුන් සංඛ්‍යාවකට පමණි. මීට පෙර වර්ෂයන්හිදී සිසුන් අතිරේකව නේවාසිකව සිටීම මඟින් මතු වූ ගැටලු බොහෝමයක් වේ. මේ සම්බන්ධව අවස්ථා ගණනාවකදී ගනු ලැබූ සාකච්ඡාවන්හි ප්‍රතිඵලයක් ලෙස නේවාසිකාගාරයන්හි පවතින ඇඳන් ප්‍රමාණයට පමණක් සිසුන් නේවාසික කිරීමටත් අතිරේකව කිසිදු සිසුවෙකු නේවාසික නොකිරීමටත් තීරණය විය. ඒ අනුව අතිරේක කිසිදු සිසුවෙකුට නේවාසිකාගාර පහසුකම් ලබා නොදෙන බව කාරුණිකව දැනුම්දෙමි.

සියලුම වසරයන්හි නේවාසිකාගාර හිමි සිසුන්ගේ ලේඛන https://welfare.sjp.ac.lk/downloads/ වෙබ් අඩවියේ පළකොට ඇති අතර එකී සිසුන්ට පමණක් නේවාසිකාගාර පහසුකම් හිමිවනු ඇත.

ඒ අනුව කිසිදු නේවාසිකාගාර පහසුකම් හිමි නොවූ සිසුවෙකුට අනවසරයෙන් නේවාසිකාගාර තුළ සිටිය නොහැකි අතර එසේ සිටින්නේ නම් ඒ සම්බන්ධව අදාල අංශ දැනුවත් කොට අවශ්‍ය පියවර ගැනීමට සිදුවන බව කාරුණිකව දැනුම්දෙමි.

නියෝජ්‍ය ලේඛකාධිකාරි
ශිෂ්‍ය සුබසාධක අංශය
2025.03.25

නියෝජ්‍ය ලේඛකාධිකාරි
ශිෂ්‍ය සුභසාධක අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ.